# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

105 - 5th Lane, Colomo - 03, Sri Lanka
Tel: +94 11 2564404, Fax: +94 11 4722632
E-mail: cmev@cpalanka.org Website: http://cmev.wordpress.com


## දකුණු පළාත් සභා ඡන්ද විමසීම - 2009

### මාධ්‍ය නිවේදනය - අංක 02

**2009- ඔක්තෝබර් 02**

**2009 ඔක්තෝබර් 2 කොළඹදීය,** ප්‍රචණ්ඩ ක්‍රියාවන් වර්ධනය වීම පිළිබඳව CMEV දැඩි අවධානය යොමුකරයි.

**ප්‍රචණ්ඩ ක්‍රියාවන්ගේ ස්වභාවය**

2009 ඔක්තෝම්බර් 01 වන දින වන විට CMEVය විසින් මැතිවරණයට අදාල ප්‍රචණ්ඩ ක්‍රියාවන් 56 ක් තහවුරු කරගෙන තිබේ. මින් 15ක් බරපතල සිදුවීම් ලෙස වර්ගීකරණය කර ඇත. තර්ජනය කර බියවැද්දීම් 6 ක් සිදුවී ඇති අතර ගිණිතැබීමේ සිදුවීම් 2 ක් ද, CMEV ය විසින් තහවුරු කරගෙන ඇත. එසේම පහරදීම සිදුවීම් 4 ක් හා එක් බරපතල තුවාල සිදුකිරීමක් ද CMEV ය වෙත වාර්තා වී ඇත.

ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් අතරින් බරපතල ගනයේ සිදුවීම් වැඩි වශයෙන් වාර්තාවන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ නි. බරපතල සිදුවීම් 15 න් 10 ක් ම වාර්තා වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙන් වන අතර සමස්ත සිදුවීම් 50 න් සිදුවීම් 24ක් වාර්තා වන්නේද එම දිස්ත්‍රික්කයෙන්ම වේ. හිනිදුම මැතිවරණ කොට්ඨාශයේ බරපතල සිදුවීම් 5 ක් වාර්තාවේ. හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්කවලින් බරපතල සිදුවීම් පිළිවෙලින් 2 ක් හා 3 ක් ට වශයෙන් වාර්තා වේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිදුවීම් 21 ක් හා මාතර දිස්ත්‍රික්කයෙන් සිදුවීම් 11 ක් CMEV වෙත වාර්තා වී ඇත.

තහවුරු වු සමස්ත බරපතල සිදුවීම් 15 න් 12 කටම වගඋත්තරකරුවන් වී ඇත්තේ එ.ජ.නි.ස යයි. බරපතල සිදුවීම් 3 කට වගකියයුත්තන් හඳුනාගෙන නැත.

මැතිවරණ ක්‍රියාවලිය තුළ පාලක එ.ජ.නි.ස යේ මනාප තරඟය තවදුරටත් වැඩිවෙමින් පවතී. එ.ජ.නි.ස. විසින් සිදුකර ඇති පැමිණිලි 13 ක් අතරින් 10 ක්ම සිදුකර ඇත්තේ පක්ෂයේ සාමාජිකයන්ට විරුද්ධවය. CMEV වෙත පැමිණිලි 32 ක් ජ.වි.පෙ. න් ලැබී ඇති අතර ඉන් 11 ක් ම එ.ජ.නි.ස. ට එරෙහිවය. වගඋත්තරකරුවන් හඳුනා නොගත් සිදුවීම් 24 ක් CMEV වෙත වාර්තා වී ඇත.

**මූලික ගැටළු**

CMEV ක්ෂෙත්‍ර නිරීක්ෂයන්ගේ වාර්තා වලින් තවදුරටත් මැතිවරණ නීති උල්ලංගනයන් සිදුවන බව තහවුරු වේ. 1988 අංක 2 දරණ පළාත්සභා ඡන්ද විමසීම් පණතේ 74 වගන්තිය මගින් අත්පත්‍රිකා දැන්වීම්

කොළඅාදිය ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව ක්‍රියාකිරීමට පොලිසියට බලය ලබාදී ඇත. එසේ තිබියදීත් ජනාධිපතිවරයා ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කරන නීති විරෝධී කට්වුට් ඉවත් කරන ලෙස නියෝග කර ඇත. CMEV ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තා කරන්නේ එම කටවුට් ඉවත්කරමින් පවතින බවයි. CMEV ක්ෂේත්‍ර නිරීක්ෂකයන් වාර්තාවලින් පවසන්නේ ගාල්ල. හිණිදුම ඇල්පිටිය හා හම්බන්තොට මැතිවරණ කොට්ඨාශවල නීති විරෝධි කටවුට් දැකගත හැකි බවයි.

මේ සම්බන්ධයෙන් CMEV ආයතනය දකුණු පළාත් නියෝජ්‍ය පොලිස්පති ජයන්ත කුලතිලක මහතාගේ විමසීමක් කල අතර ඔහු පවසා සිටියේ නීති විරෝධී ප්‍රචාරක පුවරු ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවයි. ඔහු තවදුරටත් පවසා සිටියේ 2009 ඔක්තෝබර් 01 දින වනවිට මාතර, ගාල්ල, ඇල්පිටිය සහා තංගල්ල යන පොලිස් බල ප්‍රදේශ වලින් පමණක් එවැනි ප්‍රචාරක පුවරු 80,61,39 සහ 60 ක් ගලවා ඉවත් කර ඇති බවයි.

CMEV ආයතනයට වාර්තා වු ආකාරයට එ.ජ.නි.ස. අපේක්ෂක ජෝන් සිල්වා එදිරිසූරිය (අපේක්ෂක අංක 11) මහතාගේ ආධාරකරුවන් 250-300 ක් පමණ පිරිසක් අංක 57-5815 දරණ ඩබල් කැබ් රථයෙන් ශබ්ද විකාශන යන්ත්‍ර සවිකරගෙන ප්‍රචාරක පත්‍රිකා බෙදමින් මැදකැටිය, දන්කැටිය මුහුදු මාවත ඇත්පිටිය මුස්ලිම් ගම්මානය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවට 2009 ඔක්තෝබර් 01 දින පෙ.ව. 9.30 සිට සවස 5.25 පමණ පමණ වන තෙක් සැරිසැරු බවයි.

මේ අතර එ.ජා.ප. අපේක්ෂක කපිල ජයන්ත වෙල්ලපුලි (අපේක්ෂක අංක 03) මහතා මාතර හා කඹුරුපිටිය ප්‍රදේශවල මහජනතාවට මුදල් බෙදාදීමේ චෝදනාවක් වාර්තා විය. මෙහිදි CMEV ආයතනය ඒ පිළිබඳව කපිල ජයන්ත මහතාගෙන් විමසීමක් කළ අතර ඔහු ප්‍රකාශකර සිටියේ එකී චෝදනා ප්‍රතික්ෂේප කරනු බවයි. තවදුරටත් ඔහු ප්‍රකාශකර සිටියේ තමන්ට මේ වන විටත් මහජන සහය ලැබි ඇති බවත් ඡන්ද පදනම් වැඩිකරගැනීම සඳහා මෙවැනි දිරිදීමනා අවශ්‍ය නැති බවත්ය.

පවතින තත්ත්වය තුළ මැතිවරණ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා අදාල රාජ්‍ය ආයතන නිසි ලෙස ක්‍රියාත්මක කිරීම CMEV ආයතනය අගයකරනු ලැබේ. නමුත් CMEV ආයතනයේ අත්දැකීම වන්නේ මැතිවරණ ප්‍රචාරණ ක්‍රියාවලියේ අවසන් අදියර තුල උණුසුම් තත්වයක් ඇතිවීම නිසා එවැනි තත්ත්වයකට මැතිවරණ කොමසාරිස්වරුන් අදාල පොලිස් නිලධාරින්ටත් පුහුණුව දී ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සෑම සියළු පියවරක්ම ගන්නා ලෙස CMEV ආයතනය ඉල්ලා සිටී. මැතිවරණ ගණනාවක අත්දැකීම් ලෙස බැලුවිට CMEV ආයතනයට පෙනීයන්නේ මැතිවරණ ව්‍යාපාරය පවතින කාල වකවානුව තුළ ප්‍රචණ්ඩක්‍රියා වැඩිවශයෙන් උද්ගතවන ප්‍රදේශයන් මැතිවරණ දිනයේදීත් එවැනි සිදුවීම් වලට ඉඩ ඇති බවයි.

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය [CMEV] 1997 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහි වූ සන්ධානය එකතුව මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වය ඇති වීම නිරීක්ෂණය සඳහා පිහිටුවා ගත් ස්වාධීන හා අපක්ෂපාතී සංවිධානයකි. දැනට මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය INFORM මානව හිමිකම් පිළිබඳ දත්ත කේන්ද්‍රය යන සංවිධාන වලින් සමන්විත වේ.



නීතිඥ තුසිත සිරිවර්ධන
ජාතික සම්බන්ධිකාරක